**තේ පර්යේෂණ මණ්ඩලය - 2022**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තේ පර්යේෂණ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ , 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

  - යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

  - සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

  - සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු.410,563,413 ක් වූ යන්ත්‍ර හා උපකරණ අතුරින් සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණ පිරිවැය රු. 210,645,678 ක් වූ යන්ත්‍ර හා උපකරණ තවදුරටත් උපයෝජනය කරමින් පැවතියද, එවායේ ඵලදායී ජීවිත කාලය නැවත අගය කිරීමට කටයුතු කර නොතිබුණි. | ක්ෂය වී ඇති යන්ත්‍ර සූත්‍ර නැවත ප්‍රත්‍යාගණන කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් සිදු කර ඇති අතර අදාළ කටයුතු ඉක්මනින් අවසන් කිරීමට කටයුතු කරනු ඇත. | සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද එහෙත් තවදුරටත් උපයෝජනය කරනු ලබන වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 හි 19 ඡේදය ප්‍රකාරව සේවා සැපයීම ඇතුළත් ගනුදෙනුවක, වාර්තා කරන දිනයේ දී ගනුදෙනුවේ සමාප්ති තත්ත්වය සැලකිල්ලට ගෙන ගනුදෙනුව හා ආශ්‍රිත අයභාරය හඳුනාගත යුතු වුවද වතු හිමියන් සහ වතු සමාගම් වලින් රසායනාගාර පරීක්ෂණ සඳහා ලද පස් සාම්පල් වෙනුවෙන් වූ ඇස්තමේන්තුගත රු.2,822,425 ක විශ්ලේෂණාත්මක ගාස්තු සමාලෝචිත වර්ෂයේ අයභාරයක් ලෙස හඳුනාගෙන තිබුණු නමුත් ඒ සඳහා මුදල් ලැබීම හෝ පරීක්ෂණ සිදුකිරීම හෝ මේ දක්වා සිදුවී | විශ්ලේෂණ ගාස්තු අයභාරය හඳුනා ගැනීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි 19 ඡේදය ප්‍රකාරව මීට පෙර වර්ෂවල කටයුතු කර තිබූ අතර වැරදීමකින් ගනුදෙනුව සමාප්ති නොවූ විශ්ලේෂණ ගාස්තු 2022 වර්ෂයේ අයභාරයක් ලෙස හඳුනාගෙන ඇත. | ලැබිය යුතු රසායනාගාර පරීක්ෂණ ආදායම ගිණුම්වලින් කපා හැරිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණු බැවින් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ආදායම් අධිගණනය වී තිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 10 හි 21 ඡේදය ප්‍රකාරව දැනටමත් අයභාරයේ ඇතුළත් කර ඇති මුදලක් එකතුකර ගැනීම පිළිබඳව අවිනිශ්චිතතාවයක් පැන නගින විට එකතුකර ගත නොහැකි හෝ අයකර ගැනීමේ හව්‍යතාවය දුරස්වී ඇති ප්‍රමාණය වියදමක් ලෙස හඳුනාගත යුතු වුවද මේ දක්වා විශ්ලේෂණ කටයුතු සිදුකර නොමැති 2020 සහ 2021 වර්ෂයන්හිදී ගිණුම්ගතකර ඇති විශ්ලේෂණ ගාස්තු රු.328,920 ක් සම්බන්ධව එපරිද්දෙන් කටයුතු කර නොතිබුණි. | රු.328,920 ක ලැබිය යුතු විශ්ලේෂණ රු.328,920 ක ලැබිය යුතු විශ්ලේෂණ ගාස්තු 2023 වර්ෂයේ නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. තවද අදාළ සාම්පල් සමඟ මුදල් ලබාගෙන විශ්ලේෂණ කටයුතු සිදු කිරීමට උපදෙස් ලබා දී ඇත. | ලැබිය යුතු විශ්ලේෂණ ගාස්තු ශේෂය ගිණුම්වලින් කපාහළ යුතුය. |
| (ඈ) | තලවකැලේ, රත්නපුර, හන්තාන, පස්සර සහ කොට්ටව යන ප්‍රාදේශීය කාර්යාලවල පැවති මහෝගනී, කොස් සහ යුකැලිප්ටස් යනාදී උස් සෙවන ශාක 5,654 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 13 හා 16 ඡේද ප්‍රකාරව ජෛව විද්‍යාත්මක වත්කම් ලෙස හඳුනාගෙන එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ජෛව විද්‍යාත්මක වත්කම් හඳුනා ගැනීමේ කටයුතු 2023 ජූනි මාසයේදී නිමකර ඇති අතර ඒ අනුව තක්සේරු කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ජෛව විද්‍යාත්මක වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යන්ත්‍ර හා උපකරණ වල සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම රු.382,787 ක් හා ආරම්භක සමුච්චිත ක්ෂය වටිනාකම රු.91,712 ක් වැඩියෙන් දක්වා තිබුණු බැවින් 2022 වර්ෂය අවසානයට යන්ත්‍ර හා උපකරණවල ශුද්ධ අගය රු.474,499 ක් අඩුවෙන් ගිණුම් ගතවී තිබුණි. | වැඩියෙන් ගිණුම්ගත වී ඇති ක්ෂය වටිනාකම 2023 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙළ කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව ක්ෂය ගණනය කර නිවැරදිව ගිණුම්ගත කිරීම සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධනිත කර තිබුණු පිරිවැය රු. 23,873,451 ක් වූ බස් රථ, උපකරණ හා මාර්ග යනාදී වත්කම් වර්ග 9 ක ක්ෂය වටිනාකම ගණනය කිරීමේ දෝෂයක් නිසා රු.313,122 කින් අධිගණනය වී තිබුණි. | වැඩියෙන් ගිණුම්ගත වී ඇති ක්ෂය වටිනාකම 2023 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙළ කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව ක්ෂය ගණනය කර ගිණුම්ගත කිරීම සිදුකළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ ලියාපදිංචි වාහන 03 ක් රු.3,735,000 කට ප්‍රත්‍යාගණනය කර තේ පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණු අතර, එම වාහනවල අයිතිය තේ පර්යේෂණ මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි. එසේම මේ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමක් හෝ සිදුකර නොතිබුණි. | දැනට ධාවන තත්ත්වයේ නොමැති මෙම වාහන තුන අලුත්වැඩියාව සඳහා යොමු කර, වායු විමෝචන වාර්තා ලබා ගෙන ආදායම් බලපත්‍ර ලබා ගැනීමෙන් පසු අයිතිය පවරාගැනීමට කටයුතු කරනු ලැබේ. ඉදිරියේ දී තේ පර්යේෂණ ආයතනය වෙත අයිතිය පවරාගෙන නොමැති වාහන පිළිබඳ ව ගිණුම් සටහන් තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | කඩිනමින් වාහනවල අයිතිය පවරා ගත යුතු අතර එම වාහන 3 පිළිබඳව සටහන් මඟින් හෙළිදරව් කිරීම් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සහ තේ මණ්ඩලයට තේ විකුණුම් මත ලැබිය යුතු රු.527,414 ක් වර්ෂ තුනකට වැඩි කාලයක සිට ශාන්ත කූම්බස් වතුයායේ විවිධ ණයගැති ගිණුමෙහි ඇතුළත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රජයේ ආයතනවලින් අය විය යුතු මෙම ශේෂයන් පිළිබඳ සොයා බලා වාර්තා කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව විසින් මීළඟ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | ලැබිය යුතු ආදායම කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | ශාන්ත කූම්බ්ස් වතුයායේ චෙක් රෝල් සේවකයින් සඳහා ලබා දී ඇති උත්සව අත්තිකාරම් සහ අනෙකුත් විශේෂ අත්තිකාරම් නැවත අයකර ගැනීමට නොහැකිවීම මත රු. 937,102 ක ලැබිය යුතු ශේෂයක් 2017 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතියද, එය අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ඉහත ලැබිය යුතු ශේෂය තුළ ඇතුළත් රු. 912,696 | මීළඟ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට පත්‍රිකාවක් ඉදිරිපත් කර අවශ්‍ය උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | ලබා දී ඇති අත්තිකාරම් නැවත අයකර ගැනීමට හෝ කපාහැරීමට කටයුතු කළ යුතුය. |

ක් හඳුනාගැනීම සඳහා උපලේඛන නොමැති බවද නිරීක්ෂණය විය.

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ මහා භාණ්ඩාගාරය වෙත නිරවුල් කළ යුතු වසර 03 ක් ඉක්මවා තිබුණු පිළිවෙලින් රු. 480,000 ක සහ රු.699,717 ක ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිරවුල් කර නොතිබුණු අතර යාන්ත්‍රිකරණය සම්බන්ධයෙන් වූ විශේෂ ව්‍යාපෘතිය (Special project on Mechanization) සඳහා 2018 වර්ෂයේදී අතිරේකව වියදම් වූ රු.110,224 ක මුදල මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණද විගණන දින වන විටත් එය ප්‍රතිපූරණය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ මහා භාණ්ඩාගාරය වෙත නිරවුල් කළ යුතු ශේෂයන් පිළිබඳව මීළඟ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට පත්‍රිකාවක් ඉදිරිපත් කර ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට හා ප්‍රතිපූරණය කරගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ශාන්ත කුම්බස් වතුයායේ විවිධ තොග සැපයුම්කරුවන් වෙත වර්ෂ 02 සිට 10 දක්වා ගෙවිය යුතු එකතුව රු. 1,906,780 ක ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට හෝ හිමිකම් නොපාන බව තහවුරු වන්නේ නම් ඒ සඳහා අවශ්‍ය ගැලපීම් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | පසුගිය වර්ෂ කිහිපය පුරාම මෙතෙක් ගෙවීම් සඳහා ඉල්ලීම් නොලැබුණු ණය හිමි ශේෂයන් 2023 වර්ෂයේදී ආදායමට බැර කර නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීම හෝ හිමිකම් නොපාන බව තහවුරු වන්නේ නම් ඒ සඳහා අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ.571(3) | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කොන්ත්‍රාත්වලින් රඳවාගන්නා ලද | කොන්ත්‍රාත්වල පැවති අඩුපාඩු හේතුවෙන් අදාළ රැඳවුම් මුදල් නිදහස් නොකර ගිණුම් | කොන්ත්‍රාත්වල පවතින අඩුපාඩු කඩිනමින් නිවැරදි කර |

| | | | |
|---|---|---|---|
| | රු.449,198 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වල ඉදිරියට ගෙනවිත් ඇත. එසේ කොන්ත්‍රාත් වල පැවති අඩුපාඩුකම් නිවැරදි කිරීමට කටයුතු නොකරන්නේ නම් එම රැඳවුම් මුදල් වලින් අදාළ අඩුපාඩු සකස් කිරීමට කටයුතු කරන බවට අදාළ කොන්ත්‍රාත් සමාගම් වෙත දැනුම් දී ඇති අතර මු.රෙ. 571 (3) ප්‍රකාරව ඉතිරි මුදල් මාස තුනක් තුළ ආදායමට බැර කර නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | රැඳවුම් නිරවුල් කිරීම හෝ හිමිකම් නොපාන රැඳවුම් මුදල් ආදායමට බැර කිරීමට පියවර ගත යුතුය. |
| (ii) මු.රෙ. 756 (9) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර අවසන් කිරීමේ කාල රාමුව අනුව මණ්ඩලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරි මුදල් වර්ෂයේ ජුනි 15 දිනට පෙර විගණකාධිපති වෙත යොමු කළයුතු වුවත්, 2021 සහ 2022 වර්ෂයන්හි එම වාර්තා, 2023 ඔක්තෝම්බර් 16 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර පැවති අබලි භාණ්ඩ 2022 දෙසැම්බර් මස 22 වන දින වෙන්දේසි කිරීම සිදු කරන ලද අතර එම වාර්තාව විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත. 2022 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2023 අගෝස්තු 31 දිනට අවසන් කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.77,885,774 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.77,477,947 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.155,363,721 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් සමාලෝචිත වර්ෂයේ ශාන්ත ජෝකිම් හා ශාන්ත කුම්බිස් වතුයායන්හි රු. 108,939,119 ක ශුද්ධ ලාභයක් තිබීම හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය හා සැසඳීමේදි තේ විකුණුම් ආදායම සියයට 110 කින් ද , ස්ථාවර තැන්පතු පොලී අදායම සියයට 160 කින් ද , අමු දලු අලෙවි ආදායම සියයට 69 කින් ද, වැඩිවී තිබුණු අතර පිළිවෙලින් ගමන් වියදම් හා සැපයුම් සහ පරිභෝජන වියදම් සියයට 32 කින් සහ සියයට 91 කින් වැඩිවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් හා ක්ෂණික වත්කම් අනුපාතයන් පිළිවෙලින් 4 : 1 ක් හා 3 : 1 ක් වූ අතර පසුගිය වර්ෂයේදි එම අනුපාතයන් 3: 1 ක් හා 2 : 1 ක් වී තිබුණි. 2021 හා 2022 වර්ෂයන්හි තොගය හා කෙටිකාලීන ආයෝජන වල එකතුව පිළිවෙලින් රු.168,310,718 ක් හා රු.219,821,063 ක් වී තිබීම, එනම් අධිකාරක ප්‍රාග්ධන තත්ත්වයක් හේතුවෙන් මෙම අනුපාත ඉහළ අගයක් ගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයේ විශේෂ ව්‍යාපෘති යටතේ දේශගුණික විපර්යාස සඳහා තේ ශාකයේ අනුවර්තීය ප්‍රතිචාර අධ්‍යයනය කිරීම සඳහා 2017 නොවැම්බර් 24 දින රු.12,554,583 ක් වැය කර ඉන්දියාවෙන් මිලදීගත් උපකරණය, (Walk in Type Environmental Controlled Facility) අපේක්ෂිත පිරිවිතරයන්ට නොගැළපීම හා එහි ක්‍රියාකාරීත්වය අපේක්ෂිත මට්ටමින් නොපැවතීම මත වසර 5 ක් ගතවී තිබුණද පර්යේෂණ සඳහා භාවිතා කළ නොහැකිව නිෂ්ක්‍රීයව පැවතුණි. | මෙම යන්ත්‍රය නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව සිදු කර ඇති අතර එම මිළදී ගැනීම සඳහා 2018 ජනවාරි 05 දේශීය ඒජන්තකරු හා මණ්ඩලය විසින් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර ඇත. යන්ත්‍රය ස්ථාපනය කිරීමෙන් පසු නියමිත කාර්ය සාධනයට අනුකූල නොවන බව ශාක කායික විද්‍යා අංශයෙන් දැනුම් දී ඇති අතර තේ පර්යේෂණ ආයතනයේ පිරිවිතරයන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් සැපයුම්කරු විසින් ගිවිසුමේ කොන්දේසි කඩ කර ඇත. මෙම ගැටලුව සම්බන්ධයෙන් විදේශීය සැපයුම්කරු හා දේශීය ඒජන්තකරුට අවස්ථා ගණනකදී ලිඛිතව දැනුම්දීම් සිදු කර ඇතත්, අවශ්‍ය පිරිවිතරයන්ට අනුකූලව යන්ත්‍රය ස්ථාපිත නොකිරීම හේතුවෙන් නීතිමය පියවර ගැනීම සඳහා නීතිපති වෙත දන්වා ඇත.<br>රු.12,554,583 ක මුදල හා එකී මුදල ගෙවා නිමවන තුරු ඒ මත නෛතික පොලියක්ද ලබා ගැනීම සඳහා පළමු සහ දෙවන විත්තිකරුවන්ට එරෙහිව නියෝගයක් ලබා ගැනීමට කොළඹ වාණිජ මහාධිකරණයේ නඩු පැවරීමට කටයුතු කර ඇත.<br>එසේම මිට අදාළ ප්‍රසම්පාදනය | නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කර අලාභ අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් ලබා ගැනීම සඳහා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ(NERD) තාක්ෂණික දැනුම ඇති නිලධාරියෙකු ඇතුළු කමිටුවක් පත් කිරීමට කටයුතු සූදානම් කර ඇත. | |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිළිවෙලින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට, තලවකැලේ වැවිලි සමාගමට හා රජයට අයිති ඉඩම්වල මණ්ඩලය විසින් රු.72,956,788 ක් වැයකර වලහන්දූව,දෙණියාය සහ කොට්ටව ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිලි ඉදිකර මණ්ඩලයේ වත්කම් ලෙස ගිණුම්ගතකර තිබුණි. එම ඉඩම් මණ්ඩලයේ නමට පවරා ගෙන නොතිබුණු නමුත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමක්ද සිදුකර නොතිබුණි. | තේ පර්යේෂණ ආයතනය යටතේ ක්‍රියාත්මක පාංශු හා ශාක පෝෂණ විශ්ලේෂණාගාරය භූමි කොටස සමඟ වලහන්දූව වත්ත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතට ගෙන ඇති බැවින්, රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් අභියාචනාධිකරණයේ ගොනුකර ඇති පෙත්සමේ නියෝගය ලැබෙන තෙක් භූමි කොටසේ නිත්‍යානුකූල අයිතිය සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට නොහැකි වී ඇත.<br><br>කොට්ටව උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය පිහිටි ඉඩම සංවර්ධනය කර මණ්ඩලය විසින් පරිහරණය කරන කොටස රජයට අයත් ඉඩමක් වන අතර දීර්ඝකාලීන බදු පදනම මත ලබාගැනීමට අවශ්‍ය සියලු ලේඛන බදු ඔප්පුව ලබාගැනීමට ඉඩම් කොමසාරිස් වෙත යොමු කර ඇත.<br><br>තලවාකැලේ වැවිලි සමාගමට අයත් දෙනියාය වතුයායේ ඉහළ කොටසේ අක්කර 5යි, රූඩ් 2යි, පර්චස් 1.95ක හිස් බිම් කොටසේ නිත්‍යානුකූල අයිතිය පවරාගැනීම සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය තක්සේරුව ලබාගෙන එම වාර්තාව මේ වන විට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | කඩිනමින් ඉඩම්වල අයිතිය පවරා ගැනීමට හෝ බදු පදනම මත ලබාගැනීමට කටයුතු කළ යුතු අතර එය සිදුකරන තෙක් ඉඩම් තුන පිළිබඳව සටහන් මඟින් හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා විදේශගතව සිට නැවත සේවයට නොපැමිණි සහ සේවයට පැමිණීමෙන් පසු අනිවාර්යය සේවාකාලය අවසන් වීමට පෙර සේවය අතහැර ගිය නිලධාරීන් 04 දෙනෙකු විසින් 2005 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා මණ්ඩලය සමඟ | බැඳුම්කර ගිවිසුම් උල්ලංගනය කරමින් සේවය අත හැර ගිය නිලධාරීන් 04 දෙනාට එරෙහිව ආයතනය විසින් නඩු පවරා ඇත.<br><br>හිටපු පර්යේෂණ සහකාර විදේශගත වී ඇත. ඇපකරුවන්ට විරුද්ධව කොළඹ දිසාධිකරණයේ අංක DMR/4019/11 යටතේ ගොනුකර තිබූ නඩුව | වූදිතයින් පිළිබඳ තොරතුරු සොයා ගැනීම සඳහා ගතහැකි විකල්ප ක්‍රම සොයා බලා අදාළ මුදල් අයකිරීම කළ |

| | | | |
|---|---|---|---|
| | එළඹී තිබුණු ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අදාළ බැඳුම්කර වටිනාකම වූ රු.15,054,891 ක් 2022 වර්ෂය අවසානය වන විටත් ආපසු අයකර ගෙන නොතිබුණි. | අවසානයේ තීන්දුව ලබාදෙමින් එම නිලධාරියා වෙනුවෙන් ආයතනය වැයකර ඇති මුදල හා නඩු ගාස්තු සමඟ නෛතික පොලිය ආයතනය වෙත ගෙවීමට තීන්දුව ලබාදී ඇත. එම තීන්දුවට විරුද්ධව එරෙහිව එම ඇපකරුවන් විසින් ඇපෑලක් ගොනුකර ඇත. මෙම නඩුව 2023.11.23 දින අධිකරණය ඉදිරියේ කැඳවීමට නියමිතව ඇත.<br><br>හිටපු පර්යේෂණ සහකාර වරියට විරුද්ධව මහනුවර දිසා අධිකරණයේ අංක DMR/1409/13 යටතේ නඩු පවරා ඇත. ඇය මියගොස් ඇත. ඇපකරුට විරුද්ධව නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට අනුමැතිය ලබා දෙන ලදී. මෙම නඩුව 2023.08.25 දින නැවත කැඳවීමට නියමිතව ඇත.<br><br>හිටපු පර්යේෂණ සහායක විදේශගත වී ඇත. දැනට Lethbridge College, Faculty of Agriculture, Canada යන ස්ථානයේ උපදේශකවරයෙකු ලෙස රැකියාවක නිරතව සිටින බවට කරුණු සොයාගෙන ඇත. 2022.01.10 ඉහත ලිපිනයට මුදල් ගෙවන ලෙස දන්වා ලිපියක් යොමු කර ඇත.<br><br>හිටපු අත්හදාබැලීමේ නිලධාරී 2002.10.17 සිට 2003.10.16 දක්වා ජපානයේ Tokiyo Institute of Technology වෙත පුහුණුවක් සඳහා ගොස් ඇත. ඔහුට විරුද්ධව නුවරඑළිය දිසාධිකරණයේ අංක 3126 යටතේ නඩුවක් ගොනුකර ඇත. එම නඩුව අවස්ථා 11ක් අධිකරණය ඉදිරියේ කැඳවා ඇති අතර, ඒ කිසිදු අවස්ථාවක නිලධාරියා පෙනී සිට නොමැත. | යුතුය. |
| (ඇ) | 2017 , 2018 හා 2020 වර්ෂයන්හීදී රබර් පැළ සිටුවීම, තේ අලෙවිසැලක් සඳහා වන පිරිසැකසුම් කරන ලද කන්ටේනර් ප්‍රදර්ශනාගාරයක් ස්ථාපිත කිරීම සහ ලිපිගොනු රාක්කයක් පිළියෙල කිරීම යන කාර්යයන්ට අදාළව කෙරීගෙනයන වැඩ ගිණුමේ පැවති රු.1,296,164 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද, වැඩ | රබර් පැළ සිටුවීමේ කාර්යය අවසන් කර ඇති අතර වතුයායෙන් අදාළ වැඩ අවසන් කිරීමේ සහතිකය ලබා ගෙන ගිණුම් කටයුතුවල සිදු වී ඇති මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.<br>කන්ටේනර් බහාලුම සැපයීමට හෝ එම මුදල මාසයක් තුළ ගෙවන ලෙස සැපයුම්කරුට ලිපි මඟින් දැනුම් දී ඇත. අදාළ කාලය තුළ ගෙවීමට | කන්ටේනර් ප්‍රදර්ශනාගාරය කඩිනමින් සපයාගැනීම හෝ මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කිරීම සහ අනෙකුත් කාර්යයන් සඳහා වැඩ අවසන් |

| | | | |
|---|---|---|---|
| | අවසන් කර ගිණුම් වලට ගැළපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | අපොහොසත් වුවහොත් අවශ්‍ය නීතිමය පියවර ගනු ඇත. ලිපිගොනු රාක්කයක් පිළියෙල කිරීම ආයතනයේම සේවකයින් යොදවා එම වසරේම අවසන් කර ඇති අතර 2023.07.31 දිනට පෙර වැඩ අවසන් කිරීමේ සහතිකය නිකුත් කර මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | කිරීමේ සහතික ලබා ගෙන ගිණුම් වලට ගැළපීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සර්විස් ලිමිටඩ් වෙත 2020 අප්‍රේල් 22 දින රු.4,228,700 ක මුදලකට කොන්ත්‍රාත්තුව භාර දී 2020 අගෝස්තු 20 දින රු.1,141,749 ක අත්තිකාරම් මුදලක් එම ආයතනයට ගෙවා තිබුණි.සේවා සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබුණු ලංසු ලේඛන අනුව ඇණවුම් නිකුත් කළ දිනයේ සිට දින 120 තුළ වැඩ අවසන් කළ යුතු වුවද, 2023 ජුනි 30 වනවිට වසර 3ක් ඉක්මවා ගියද එහි ප්‍රගතිය සියයට 51ක් පමණක් බව විගණනයේදී නිරීක්ෂණය විය. | 2020 අප්‍රේල් 22 දිනැති මිලදී ගැනුම් ඇණවුම භාර දුන් කාලය පුරා රට තුළ ඇති වූ වසංගත තත්ත්වය හමුවේ මෙම ව්‍යාපෘතියේ කටයුතු බලාපොරොත්තු වූ පරිදිම ඉටු කර ගැනීමට නොහැකි විය. එසේ හෙයින් අදාළ සැපයුම්කාර ආයතනය 2023 ජුනි 30 දක්වා තවදුරටත් කාර්යසාධන බැඳුම්කරය දීර්ඝ කොට මෙම කටයුතු සිදු කරගෙන යන ලද අතර 2023 ජූලි 31 දිනට සම්පූර්ණ කර භාර දෙන බවට සැපයුම්කාර ආයතනය දැනුම් දී ඇත. එමෙන්ම 2023 ජුනි 30 දින සිට ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කිරීම සිදු කරන බවට දැනුම් දීමට කටයුතු කර ඇත. | කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි කටයුතු කඩිනමින් අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තේ පර්යේෂණ ආයතනයට අයත් තලවකැලේ ලැම්ලියර් වතුයායේ හෙක්ටයාර 1.367 ක භූමි ප්‍රමාණය, කර්මාන්තශාලාව හා සියලුම ගොඩනැගිලි 2003 වර්ෂයේදී පෞද්ගලික සමාගමකට වසර 50 ක කාලපරිච්ඡේදයක් සඳහා බදු දී තිබුණද ගිවිසුම් ප්‍රකාරව බදු කුලී නොගෙවීම මත 2016 වර්ෂයේදී අදාළ දේපළ නැවත අත්පත් කරගෙන තිබුණු නමුත් අත්පත්කරගත් දින සිට 2023 ජුනි 07 දින දක්වා එනම් වසර 07 ක් ඉකුත් වී ඇතත් එම වත්කම් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | ලැම්ලියර් වතුයායේ ඉදි කර ඇති කර්මාන්ත ශාලාව, වතු අධිකාරී නිල නිවස හා අනෙකුත් සියලුම ගොඩනැගිලි 2007 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් මිලදී ගන්නා ලද අතර, එම දේපළ මණ්ඩලය සතු නීත්‍යානුකූල දේපලකි. මේ සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2023 මැයි 24 දිනැති ව මණ්ඩලය වෙත යොමු කරන ලද ලිපියේ උපදෙස් පරිදි රාජ්‍ය ඉඩම් බැහැර කිරීමේ සීමාවන් පනවා ඇති බැවින් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග හා උපදෙස් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් ලබා ගැනීමට කටයුතු සූදානම් කර ඇත. | මෙම දේපළ ඵලදායීව උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මණ්ඩලයේ අභ්‍යන්තර පාලන නිර්දේශ අනුව කර්මාන්තශාලාවේ විවිධ අදායම් මඟින් එහි කිසිදු වියදමක් දැරිය නොහැකි අතර රු.500,000 ක රක්ෂණාවරණ සීමාව ඉක්මවා යන්නේනම් එදිනම හෝ එසේ නොමැතිනම් සතියකට එක වතාවක් හෝ බැංකු ගත කිරීම කළ යුතු වුවද, 2022 දෙසැම්බර් මාසයේ ශාන්ත කුම්බ්ස් කර්මාන්තශාලාවේ දිනපතා එකතු වූ මුදල් සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයේදී, රු.1,268,935ක එකතු වූ මුදල්, එම දිනයේ සිට තැන්පත් කරන දින දක්වා දින 5 සිට දින 16ක කාලයක් කර්මාන්තශාලවේ රඳවාගෙන තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව වතුයායේ දිනපතා එකතුවන මුදල් බැංකුගත කිරීම සඳහා වතු අධිකාරි වෙත තරයේ උපදෙස් ලබා දී ඇති අතර තේ පර්යේෂණ ආයතනය විසින්ද වතුයාය සම්බන්ධයෙන් සිදු කරන අධීක්ෂණ කටයුතු වැඩි කිරීමට කටයුතු කර ඇත. | මණ්ඩලයේ අභ්‍යන්තර පාලන නිර්දේශ අනුව එකතු වූ මුදල් නිසි පරිදි බැංකුගත කිරීමට කටයුතු කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් වන අධීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීමට පියවර ගත යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 27 (1) වගන්තිය යටතේ වූ තේ පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදල 1959 ජූනි 01 දින සිට අනුමත අර්ථසාධක අරමුදලක් බවට 2014 ඔක්තෝබර් 30 දින කම්කරු කොමසාරිස් විසින් සහතික කර තිබුණි. මෙම අර්ථසාධක අරමුදලේ කළමනාකරණ රීති සංග්‍රහයේ 4 ( i ) වන වගන්තිය ප්‍රකාරව අරමුදලේ භාරකාර මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා (භාරකාර මණ්ඩලයේ සභාපති), අරමුදලේ සභාපති විසින් අධ්‍යක්ෂවරු අතරින් නම් කළ සාමාජිකයින් 02 ක් හා අරමුදලේ සාමාජිකයින් අතරින් මහා සභාවේදී පත්කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙකුගෙන්ද, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නම් කළ අරමුදලේ සාමාජිකත්වය නොදරන නිලධාරින් දෙදෙනෙකුද | 2021 දෙසැම්බර් 31 දින පැවැත් වූ මහා සභා රැස්වීමේදී, භාරකාර මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව සංශෝධනය කිරීමට අදාළ යෝජනාව සම්මත කර ගෙන ඇති අතර එම සංශෝධිත ව්‍යවස්ථාව අනුමැතිය සඳහා 2022 ජුනි 23 සහ 2022 ජූලි 25 යන දිනැති ලිපි මඟින් කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ ද එම සංශෝධනය සඳහා අනුමැතිය ලබා දී නොමැත. කෙසේ වුවද අර්ථසාධක අරමුදල පිළිබඳ තීරණ ගනු ලබන්නේ මහා සභාව විසිනි. නැවත වතාවක් කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීම සඳහා සංශෝධන ලිපිය සකස් කර ඇත. | රීති සංග්‍රහය සංශෝධනය කර ගැනීමට හෝ එසේ කළ නොහැකි නම් පවතින රීති සංග්‍රහය පරිදි සාමාජිකයින් පත් කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ඇතුළුව සාමාජිකයන් 07 ක ගෙන් සමන්විත විය යුතු වුවද සභාපති විසින් තේ මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනා 2023 ජූලි 31 විගණන දින විටත් භාරකාර මණ්ඩලයට පත්කර නොතිබුණි. | | |
| (ආ) ශාන්ත කූම්බ්ස් වතුයායේ 2017 සහ 2018 වර්ෂයන්හිදී මණ්ඩලයේ ගණකාධිකාරීන් දෙදෙනෙකුගේ අධීක්ෂණයෙහි පැවති දුර්වලතාවයෙන් සහ කර්මාන්තශාලා නිලධාරීන් තිදෙනෙකු විසින් සිදුකර තිබුණු මූල්‍ය වංචාවන් හේතුවෙන් අහිමි වූ මුදල ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ රු. 10,299,327 ක ණයගැති ශේෂයක් වර්ෂ 05 කට වැඩිකාලයක සිට පවතින නමුත් අදාළ පරීක්ෂණ කටයුතු අවසන් කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් එම මුදල් අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | 2017/2018 වර්ෂවල තේ පර්යේෂණ ආයතනයට අයත් ශාන්ත කූම්බ්ස් වතු කාර්යාලයේ තේ අලෙවිසැලෙහි තේ අලෙවියේදී සිදු කර ඇති රුපියල් 7,073,432.25 ක මූල්‍ය වංචාව සම්බන්ධයෙන් සහ වතු කාර්යාලයේදී ජංගම ගිණුම් වල මුදල් තැන්පතු කිරීමේදී සිදු කර ඇති රුපියල් 5,207,571.27 ක මූල්‍ය වංචාවට අදාළ මු.රෙ. 104 (4) අවසන් වාර්තා අනුව ඉහත මූල්‍ය අක්‍රමිකතාවයන්ට වගකිව යුතු නිලධාරීන් සඳහා නීතිමය පියවර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත සියලුම ලේඛනයන් සිද්ධීන් දෙකට අදාළව වෙන වෙනම යොමු කිරීමට කටයුතු කර ඇත.<br>එසේම ඒ සම්බන්ධයෙන් පිළිවෙලින් කොළඹ වානිජ අපරාධ විමර්ශන කාර්යාංශය සහ නුවරඑළිය විශේෂ අපරාධ විමර්ශන කාර්යාංශය මඟින් අපරාධ නඩු ගොනු කර ඇත.<br>තේ පර්යේෂණ ආයතනය විසින්ද මේ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කරනු ඇත. | මූල්‍ය වංචාව සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු නොපමාව අවසන් කිරීමටද, නෛතික ක්‍රියාමාර්ග කඩිනම් කර ගැනීමටද පියවර ගත යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයේ අනුමත කාර්යය මණ්ඩලය තුළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු 36 ක් පැවතියද සමාලෝචිත වර්ෂයේදී ඉන් තනතුරු 23 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තනතුරු අතර අංශ ප්‍රධානී තනතුරු 04 ක්ද ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුරු 11 ක්ද ප්‍රධාන උපදෙස් නිලධාරී තනතුරු 05 ක්ද අභ්‍යන්තර උසස්වීම් මඟින් පිරවිය යුතු වුවද වර්ෂ 03 කට වැඩි කාලයක සිට මෙම තනතුරු පුරප්පාඩුව පැවතුණි. | අංශ ප්‍රධානී තනතුර අභ්‍යන්තර උසස් වීමක් වන අතර එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ පසු අදාළ නිලධාරීන් සඳහා ඉදිරියේදී අනුමැතිය ලබා ගෙන අභ්‍යන්තර දැන්වීම් පළ කර පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත.<br><br>ප්‍රධාන පර්යේෂණ නිලධාරී හා ප්‍රධාන උපදෙස් නිලධාරී තනතුරුද අභ්‍යන්තර උසස්වීම් වන අතර එම තනතුරු සඳහා මේ වන විට අභ්‍යන්තර වශයෙන් සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් නොමැත. | පුරප්පාඩුව පවතින අනුමත කාර්යය මණ්ඩලයේ අත්‍යවශ්‍ය තනතුරු සඳහා කඩිනමින් බඳවාගැනීම් කළ යුතු අතර අනවශ්‍ය තනතුරු වේ නම් ඒවා අහෝසි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මණ්ඩලයේ මෙහෙයුම් සහ උපදෙස් නිලධාරී තනතුරුවලින් සියයට 52 ක්ද තාක්ෂණ හා තාක්ෂණික නොවන කළමනාකරණ සහකාර තනතුරුවලින් සියයට 42 ක්ද ප්‍රාථමික මට්ටමේ (පුහුණු) තනතුරු වලින් සියයට 55ක් ද ප්‍රාථමික මට්ටමේ (නුපුහුණු) තනතුරු වලින් සියයට 46ක්ද පුරප්පාඩුව පැවතුණි. එමෙන්ම ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ නිලධාරී තනතුරු 17 ක් හා අධ්‍යයන හා පර්යේෂණ නිලධාරී තනතුරු 27 ක් පැවතියද සමාලෝචිත වර්ෂය අවසානය වන විට පිළිවෙලින් ඉන් තනතුරු 5ක් හා 14ක් පුරප්පාඩුව පැවතුණි. මෙම තනතුරු වල පුරප්පාඩුව වීම ආයතනයේ පර්යේෂණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම කෙරෙහි සෘජුව බලපාන බව විගණනයේදී නිරීක්ෂණය විය. | ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ නිළධාරී තනතුරු අධ්‍යයන හා පර්යේෂණ නිලධාරී තනතුරු හා මෙහෙයුම් හා බලාත්මක ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. කළමනාකරණ සහකාර තාක්ෂණ කාණ්ඩයේ තනතුරක් වන කළමණාකරණ සහකාර (ගබඩාකරණ) තනතුරෙහි බඳවා ගැනීමට අදාලව පුවත්පත් දැන්වීම් පළ කර සම්මුඛ පරීක්ෂණ පවත්වා තෝරාගත් අයදුම්කරුවන් පිළිබඳ අවසාන නිර්දේශයන් මණ්ඩලය වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමැතියට යොමු කර ඇත. එම අනුමැතිය ලැබුණු පසු පත්වීම් ලිපි ප්‍රදානය කිරීමට නියමිතව ඇත. එමෙන්ම තාක්ෂණ නොවන තනතුරු වල අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවූ අතර මේ වන විට ඉදිරියට බඳවා ගැනීමේ කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය අනුමැතිය ලැබී නොමැති බැවින් බඳවා ගැනීම් නතර කර ඇත. | පුරප්පාඩුව පවතින අනුමත කාර්යය මණ්ඩලයේ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා කඩිනමින් බඳවාගැනීම් කළ යුතු අතර අනවශ්‍ය තනතුරු වේ නම් ඒවා අහෝසි කළ යුතුය. |
| (ඇ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/ 2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි තාවකාලික හෝ අනියම් පදනම මත බඳවාගෙන තිබුණු දින 180 ඉක්මවූ සේවකයින් 93 කට 2014 ඔක්තෝබර් 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පත්වීම් ලබාදී තිබුණද එම සේවකයින් මණ්ඩලයේ කාර්යය මණ්ඩලයට ඇතුළත් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ප්‍රාථමික සේවා ගණයේ තනතුරු සඳහා ශ්‍රම බලකාය මඟින් පමණක් බඳවා ගැනීමට උපදෙස් ලබා දී ඇත. | 2014 වර්ෂයේ පත්වීම් ලබාදුන් සේවකයන්, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේදීද අවසන් කර නොතිබුණි. | කාර්ය පරිපාටි අත්පොත සැකසීම ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය තෝරාගෙන තිබූ අතර එම ආයතනය විසින් ඉල්ලා තිබූ අත්තිකාරම් මුදල ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයට අනුකූල නොවූ බැවින් කාර්ය පරිපාටි අත්පොත සංශෝධනය කිරීම සඳහා අභ්‍යන්තර කමිටුවක් පත් කිරීමට සහ බාහිර විශේෂඥයෙකුගෙන් උපදෙස් ලබා ගැනීමට ඉදිරිපත් කරන ලද මණ්ඩල පත්‍රිකාවට තේ පර්යේෂණ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු මාස තුනකින් නිම කිරීමට අපේක්ෂා කර ඇත. | මානව සම්පත් කළමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොත සකස් කිරීමේ කටයුතු නොපමාව නිම කළ යුතුය. |